සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2024

# පුරවැසි අධ්‍යාපනය

07 ශ්‍රේණිය — කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- **අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පූර්වාචාර්යවරුන් ලෙස පිළිගනු ලබන්නේ,

(1) ගුරුවරුන් (2) දෙමව්පියන් (3) ශිෂ්‍යයන් (4) වැඩිහිටියන්

02. සමාජයේ අයහපතට හේතු වන ආයතනයක් වන්නේ,

(1) පුස්තකාලය (2) තැබෑරුම

(3) අමද්‍යප ව්‍යාපාරය (4) ප්‍රජා සංවර්ධන සමිති

03. යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා පවුලෙන් ඔබට ලැබෙන හිමිකම්,

(1) අයිතිවාසිකම් වේ. (2) වගකීම් වේ.

(3) යුතුකම් වේ. (4) ඉවසීම වේ.

04. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ඇමතිය හැකි දුරකථන අංකය වන්නේ,

(1) 1918 (2) 1929 (3) 1919 (4) 1912

05. සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇති විය හැකි අවාසියක් වන්නේ,

(1) සුන්දර වූ ළමා කාලය අහිමිවීම. (2) ශ්‍රමය සූරාකෑම.

(3) සමාජ විරෝධී ක්‍රියාවලට යොමුවීම. (4) වදහිංසාවලට ලක්වීම.

- **අංක 06 - 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. සේවකයින් විශ්‍රාම යාමට ප්‍රථම මාස හයකට පෙර තමා සේවය කරන ආයතන ප්‍රධානියා මාර්ගයෙන් විශ්‍රාම දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතු ය. ( )

07. අභියෝග යනු ක්ෂණික ව විසඳුම් නො ලැබෙන ගැටලු හා බාධාකාරී තත්ත්වයන් වේ. ( )

08. ශ්‍රී ලාංකික ජන සමාජය, බහු සංස්කෘතික ජන සමාජයක් සඳහා දිය හැකි හොඳ ම නිදසුනකි. ( )

09. වර්තමානයේ ලොව බොහෝ රාජ්‍ය බහු සංස්කෘතික සමාජ නො වේ. ( )

10. රාජ්‍ය ලාංඡනයේ හිමිකාරීත්වය සහ භාවිත කිරීමේ අයිතිය හිමිවන්නේ ජනාධිපතිවරයාටයි. ( )

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල හිස් තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.**

(අයන්වුඩ් / නාග්කේශර් / සාරධර්ම / එස්. එම්. සෙනෙවිරත්න / සංස්කෘතික / වගකීම)

11. වර්තමානයේ අප භාවිත කරන රාජ්‍ය ලාංඡනය නිර්මාණය කරන ලද්දේ ........................................ මහතා ය.

12. යුතුකම් ඉටුකිරීමට ඇති බැඳීම ........................................................................................ නම් වේ.

13. ..................................................... දායාද ආරක්ෂා කරගැනීම අතිශය වැදගත් වේ.

14. ඉංග්‍රීසි භාෂාවෙන් නා ගස ........................................................ ලෙස හැඳින්වේ.

15. පුද්ගලයා, සමාජය හා ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන මානුෂික ගුණාංග ........................................................... වේ.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා (A) හා (B) තීරු ගළපා නිවැරදි අක්ෂරය වරහන තුළ යොදන්න.**

| | (A) | | | (B) |
|---|---|---|---|---|
| 16. | පහතරට ප්‍රදේශ | (   ) | A | ආගම |
| 17. | ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා | (   ) | B | නිර්මාණශීලී චින්තනය |
| 18. | සංස්කෘතික විවිධත්වය | (   ) | C | නිල් මානෙල් |
| 19. | අභියෝග ජය ගැනීම | (   ) | D | සුහදශීලී බව |
| 20. | යහපත් පුරවැසියෙකු | (   ) | E | ඩී. එස්. සේනානායක මහතා |
| | | (   ) | F | ජේ. ආර්. ජයවර්ධන මහතා |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ජන සමාජයේ කුඩා ම ඒකකය කුමක් ද?

(ii) වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක දෙක නම් කරන්න.

(iii) DNA ව්‍යුහය භාවිත කරන අවස්ථා දෙකක් නම් කරන්න.

(iv) සමාජයේ යහපත් බලවේග දෙකක් නම් කරන්න.

(v) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් දෙකක් ලියා දක්වන්න.

(vi) ලොකු තාත්තා හැඳින්වීම සඳහා ප්‍රාදේශීය ව භාවිත වන ඇමතුම් පද දෙකක් නම් කරන්න.

(vii) ජන සමාජය තුළ පවත්නා අන්තර් සම්බන්ධතා වර්ග දෙකක් නම් කරන්න.

(viii) දෛනික ව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු වර්ග දෙකක් ලියා දක්වන්න.

(ix) වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට යොදා ඇති විධි විධාන දෙක නම් කරන්න.

(x) හින්දු භක්තිකයන්ගේ ආගමික උත්සව දෙකක් නම් කරන්න. (ල. 2 x 10 = 20)

02. (i) පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(ii) පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත්වීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) (a) ''විභාගය හොඳින් සමත්වීම'' යන අරමුණ ජයග්‍රහණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(b) පවුලේ සාමාජිකයකු ලෙස වර්ධනය කරගත යුතු යහපත් ගුණාංග තුනක් ලියා දක්වන්න. (ල. 03)

03. (i) ගුරු වදන මහිම ය

ගරු කර ගැනුම යුතුම ය

..........................................................................................

..........................................................................................

ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ල. 02)

(ii) ආගමික ආයතන මගින් ඉටුවන සේවාවන් තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) සමාජයේ යහපතට හේතු වන ආයතන දෙකක් නම් කොට එක් ආයතනයක් මගින් ඉටුවන සේවාවන් තුනක් ලියා දක්වන්න. (ල. 05)

04. (i) ජන සමාජයේ පවතින අයිතිවාසිකම් යනු මොනවා ද? (ල. 02)

(ii) අයිතිවාසිකම්වල මූලික ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) පහත දී ඇති අයිතිවාසිකම් වර්ග සඳහා උදාහරණ සපයන්න. (ල. 05)

අයිතිවාසිකම්

සිවිල්

උදා:- 1. .............................................

2. .............................................

3. .............................................

දේශපාලන

උදා:- 1. .............................................

2. .............................................

05. (i) සංස්කෘතිය යන්න නිර්වචනය කරන්න. (ල. 02)

(ii) සංස්කෘතික අංග තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) (a) සංස්කෘතික දායාදවලට හානි වන අවස්ථා පිළිබඳව දැනුවත් කළ හැකි ආයතන තුනක් නම් කරන්න. (ල. 03)

(b) සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීම සඳහා පුරවැසියෙකු ලෙස අපට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න. (ල. 02)

06. (i) සිංහල, බෞද්ධ සංස්කෘතියට අයත් ආගමික උත්සව දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) පහත රූප මගින් දැක්වෙන ස්ථාන නම් කරන්න. (ල. 03)

| | | |
|---|---|---|
|  |  |  |
| A | B | C |

(iii) (a) 1948 ජාතික කොඩි කමිටුවේ සභාපති හා කමිටු ලේකම් නම් කරන්න. (ල. 02)

(b) ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා තුනක් නම් කරන්න. (ල. 03)

07. (i) ශ්‍රී ලංකා ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) රාජ්‍ය ලාංඡනයේ පහත සංකේතවල අර්ථය ලියා දක්වන්න. (ල. 03)

(a) ධර්ම චක්‍රය

(b) වී කරල්

(c) පුන්කලස

(iii) රූපය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(a) මෙම රූපයෙන් දැක්වෙන ක්‍රීඩාව කුමක් ද? (ල. 01)

(b) මෙය ආරම්භ වූයේ කුමන වර්ෂයේ කුමන රටේ ද? (ල. 02)

(c) මෙම ක්‍රීඩාව ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ කුමන වර්ෂයේ ද? කවුරුන් විසින් ද? (ල. 02)

## පිළිතුරු පත්‍රය

**I කොටස**

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 2 | (03) | 1 | (04) | 3 | (05) | 2 | (06) | ✓ | (07) | ✓ | (08) | ✓ |
| (09) | × | (10) | ✓ | (11) | එස්. එම්. සෙනෙවිරත්න | | | | | (12) | වගකීම | | | | |
| (13) | සංස්කෘතිය | | | (14) | අයන්වුඩ් | (15) | සාරධර්ම | | | (16) | | (17) | | (18) | |
| (19) | | (20) | | | | | | | | | | | | | |

(ලකුණු 2 x 20 = 40 යි.)

**II කොටස**

01. (i)